**වන සත්ත්ව සංරක්ෂණ අරමුදල - 2021**

**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

වන සත්ත්ව සංරක්ෂණ අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලැබීම් ගෙවීම් ගිණුම, ස්කන්ධ වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශනතුලින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනා ලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 22 ඡේදයෙහි සඳහන් කොන්දේසි සපුරා නොමැති විටක ප්‍රතිපාදන හඳුනා නොගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ඩෙක්ස්ටොප් යන්ත්‍ර 46 ක් මිලදී ගැනීම සඳහා රු.11,107,000 ක ගිවිසුමකට එළඹ තිබුණු අතර ඒ සඳහා ගෙවීමක් හෝ යන්ත්‍ර ලැබී නොතිබියදී මූල්‍ය ප්‍රකාශනවල වියදමක් හා වගකීමක් ලෙස දක්වා තිබුණි. | වන සත්ත්ව සංරක්ෂණ අරමුදලේ ගිණුම් උපචිත සංකල්පය අනුව ගිණුම් තබන බැවින් ඩෙක්ස්ටොප් යන්ත්‍ර මිලදී ගැනීම ගිවිසුම් ප්‍රකාරව 2021 වර්ෂයේ මිලදී ගැනීමට බැඳී ඇති බැවින් එය බැරකමක් ලෙස ගිණුම්ගත කර ඇත. නමුත් වත්කමක් ලෙස ගිණුම්ගත කර නොමැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විට වැඩ අවසන් කර භාවිතයට ගනු ලබන වටිනාකම රු.33,252,714 ක් වූ ගොඩනැගිලි 04 ක් ප්‍රාග්ධනිත නොකර කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධනිත කර තිබූ ගොඩනැගිලි සඳහා දරන ලද රු.49,703,791 ක් වූ වියදම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ගලායාම් යටතේ දේපළ මිලට ගැනීම් ලෙස දැක්විය යුතු වුවද , එම අගය කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි. | -එම- | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ප්‍රවාහයන් නිවැරදිව හඳුනාගෙන දැක්වීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී උසාවි දඩ මුදල් ලැබීම් රු.1,908,000 ක් කැපකරු මාපිය ක්‍රමය සඳහා දායක මුදල් ලැබීම් වශයෙන් දක්වා තිබුණි. තවද, වැලි ගොඩදැමීමේ බලපත්‍ර ගාස්තු ලැබීම් රු.9,457,100 ක් ඇත්අතුරු සෙවනේ පහසුකම් ගාස්තු ලැබීම් වශයෙන් දක්වා තිබුණි. | -එම- | නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | කලාපවලින් ලබා ගන්නා දඩ මුදල් වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන සැසඳීමේදී නඩු 02 කට අදාල ලැබිය යුතු උසාවි දඩ මුදල් රු.130,000 ක් වැඩියෙන් හා නඩු 05 කට අදාල ලැබියයුතු උසාවි දඩ මුදල් රු.333,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. තවද, දකුණු කලාපයේ ලැබියයුතු උසාවි දඩ මුදල් ගණනය කිරීමේදී නඩු 09 කට අදාල උසාවි දඩ මුදල් රු.275,000 ක් දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | -එම- | උසාවි දඩ මුදල් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 104(1) | පාඩුවක් හෝ අලාභ හානියක් හෝ සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමත්, එයට වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහාත් පරීක්ෂණ ආරම්භ කළ යුතු වුවද වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට පැවත එන අලි වෙඩි 9,188 ක් එනම් ආසන්න වශයෙන් රු.800,372 ක පමණ අලි වෙඩි ඌණතාවය සම්බන්ධයෙන් එවැනි පරීක්ෂණයක් සිදුකර නොතිබුණි. | මෙම අලිවෙඩි ඌනතාවය 2010 වර්ෂයේ සිදුවූවක් වුවද 2014 වර්ෂයේදී නැගෙනහිර කලාපයේ සහ 2016 වර්ෂයේදී කලාප කිහිපයකම අලිවෙඩි සම්බන්ධ විමර්ශනයක් සිදුකර ඇත. එම විමර්ශන වාර්තාව අනුව මේ වන විට කටයුතු කරමින් පවතින බව දන්වමි. | මුදල් රෙගුලාසි සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 625(3) | ප්‍රදාන දායකයන්ගෙන් කෙලින්ම මුදල් ප්‍රේෂණ ලැබෙන දෙපාර්තමේන්තු එකී ලැබීම් භාණ්ඩාගාරයේ තැන්පත් කළ යුතුය. එබඳු ප්‍රදාන ප්‍රයෝජනයට ගැනීම සඳහා ඇස්තමේන්තුවල | වන සත්ත්ව සංරක්ෂණ අරමුදලට අදාළව නිකුත් කර ඇති 1966 නොවැම්බර් 29 දින දරන අංක 14830 ගැසට් පත්‍රය අනුව “වන සත්ත්ව සංරක්ෂණ අරමුදලට කරනු ලබන සියළු පරිත්‍යාග අරමුදලට | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ප්‍රතිපාදන සලසා ඇති විට, දෙපාර්තමේන්තු විසින් අදාල ප්‍රදාන ප්‍රතිපාදනයෙන් අරමුදල් වෙන් කිරීමක් ලබා ගැනීම සඳහා විදේශ සම්පත් අධ්‍යක්ෂක ජනරාල්වරයා මගින් රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂක ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කර, එය මොනයම් හෝ බැරකමක් ඇති කර ගැනීමට ප්‍රථම ලබා ගත යුතුය. එසේ වුවද, විදේශීය පුද්ගලයකු විසින් පරිත්‍යාග වශයෙන් සෘජුවම දෙපාර්තමේන්තු බැංකු ගිණුමට බැර කරන ලද රු.10,079,912 ක මුදලක් මුදල් රෙගුලාසිවල විධිවිධාන අනුගමනය කිරීමකින් තොරව වන සත්ත්ව සංරක්ෂණ අරමුදලට ආදායමක් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. | ගෙවිය යුතුය “ යන්න සඳහන්ව ඇති බැවින් පරිත්‍යාග අරමුදලේ ආදායමට ගෙන ඇත. එසේම එම ගැසට් පත්‍රය සහ 2003.06.23 දිනැති අංක 1294/1 ගැසට් පත්‍රය ප්‍රකාරව පරිත්‍යාග අරමුදලේ වියදම් සඳහා යොදවා ඇත. | |
| **(ආ)** | **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | | | |
| | i. 2.14.1 වගන්තිය අතිරේක) (35 | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු මගින් වෙළඳපල මිල සැඳැහුම් ක්‍රමය අනුගමනය කර භාණ්ඩ හා සේවා මිලදී ගත හැක්කේ | වෙළඳපල මිල සැඳැහුම් ක්‍රමය යටතේ භාණ්ඩ හා සේවා මිලදී ගත හැක්කේ ලංසු කැඳවීමට අවම දින 07 ක කාලයක් | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | රු.මිලියන 10 ක් දක්වා පමණක් වුවද ඊට පටහැනිව 2021 වර්ෂයේදී වෙළඳපල මිල සැදැහුම් ක්‍රමය අනුගමනය කරමින් රු.17,656,200 ක් වටිනා පරිගණක යන්ත්‍ර මිලදී ගැනීම, සිදු කර තිබුණි. | ලබාදී මිලියන 10 කට යටත්ව වුවද රු.17,656,200 ක් වටිනා පරිගණක යන්ත්‍ර මිලදී ගෙන ඇත්තේ ලංසු කැඳවීමට දින 16 ක කාලයක් ලබාදී ශ්‍රී ලංකා ටෙලිකොම් ජාතික දුරකථන නාමාවලියේ සඳහන් දේශීය නියෝජිත ආයතනයක් වෙතින් සීමිත තරගකාරී ලංසු කැඳවීම යටතේ බව සඳහන් කරමි. | |
| | ii. 4.2.2 වගන්තිය | ප්‍රසම්පාදනය ආරම්භක අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාලක්‍රමානුගතව විස්තර කරන ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කල යුතු වුවද 2021 වර්ෂය සඳහා අලිවෙඩි මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයේදී එලෙස කටයුතු කර නොතිබුණි. | මින් ඉදිරියට එවැනි අඩුපාඩු මග හරවා ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී. | -එම- |
| **(ඇ)** | 2019 ජුනි 13 දිනැති හා අංක 01/2018(i) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ජේදය | සියලුම රාජ්‍ය ආයතන විසින් සපයනු ලබන්නාවූ විවිධ සේවාවන් සඳහා දැනට අය කරනු ලබන ගාස්තු සියයට 15 කින් ඉහළ දැමිය යුතු වුවද 2006 පෙබරවාරි 20 | 2019 ජුනි 13 දිනැති හා අංක 01/2018(i) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ජේදය ප්‍රකාරව 2006 පෙබරවාරි 20 දිනැති අංක 1433/4 දරන අති විශේෂ ගැසට් පත්‍රය | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | දිනැති අංක 1433/4 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ජාතික රක්ෂිතයක හෝ අභයභූමියක පිහිටි ජලාශයක මසුන් ඇල්ලීමට භාවිත කරනු ලබන ධීවර යාත්‍රා සඳහා අය කරනු ලබන රු.250 ක බලපත්‍ර ගාස්තුව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සංශෝධනය කර නොතිබුණි. | සංශෝධනය කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | |
| **(ඈ)** | 2002 පෙබරවාරි 11 දිනැති අංක 16/2002 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛයෙහි 01.1 හා 01.2 ඡේද | ජාතික උද්‍යානවල ප්‍රවේශපත්‍ර ආදායමින් අය කරනු ලබන සේවා ගාස්තු කාර්ය මණ්ඩලය අතර බෙදාහැරීමේදී වැටුප් රහිත නිවාඩු දින 01 සිට දින 10 දක්වා ලබාගත් අයගෙන් සියයට 10 ක් හා දින 11 ට වඩා වැටුප් රහිත නිවාඩු ලබාගත් අයගෙන් සියයට 50 වශයෙන් අඩුකරගනු ලබන සේවා ගාස්තුව වන සත්ත්ව සංරක්ෂණ අරමුදලට නැවත බැර කලයුතු වුවද, නිලධාරීන් 14 දෙනෙකුගෙන් අඩුකර ගන්නා ලද රු.1,829,200 ක මුදල බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.710,716,620 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.282,296,192 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.993,012,811 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට අරමුදලේ ප්‍රධාන ආදායම් සංරචක ලෙස උද්‍යාන පිවිසුම් ගාස්තු රු.366,162,825 කින්, සේවා ගාස්තු රු.51,717,049 කින් හා උද්‍යානවලට වාහන ඇතුළත් කිරීමේ ගාස්තු රු.7,892,657 කින් පහළයාමත් වියදම් සංරචක ලෙස නඩත්තු සේවක ආහාර දීමනා රු.31,167,869.39 කින් ඉහළයාමත් 2021 වර්ෂයේ නව වියදම් ලෙස උද්‍යානවල සංචාරකයින්ගේ හා සතුන්ගේ පහසුකම් වැඩි දියුණු කිරීම්, නඩත්තු කටයුතු සඳහා අවශ්‍ය උපකරණ, කාර්යාල උපකරණ සඳහා රු.26,014,721 ක වියදමක් දැරීමද ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අලි මිනිස් ගැටුම අවම කරගැනීම සඳහා ප්‍රචණ්ඩකාරී අලි පාලනය කිරීමේ අරමුණෙන් රු. මිලියන 862 ක ඇස්තමේන්තුගත පිරිවැයකට කොන්ක්‍රිට් කණු යොදා ගනිමින් අලි වැටක් ඉදිකිරීමට 2020 අප්‍රේල් 30 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබූ අතර එම ඉදිකිරීම් කටයුතු ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත පවරා දී තිබුණි. පසුව සිදුකරන ලද වෙනස්කම් හේතුවෙන් අලි වැට වෙනුවට රු.මිලියන 304 ක ඇස්තමේන්තුගත පිරිවැය වූ අලි අගලක් කැපීමට තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදු කෙරේ. | | |
| (අ) අගල කැපීම සඳහා අදාල නොවන ගොඩනැගිලි ඉදිකිරීමේ රේටයන් පදනම් කරගෙන ඇස්තමේන්තු සකස් කර තිබිම හේතුවෙන් වාරිමාර්ග රේටය සමඟ සැසඳීමේදී කියුබික් මීටරයක් රු.312 කින් ඇස්තමේන්තුව වැඩි වී තිබුණු අතර ඉංජිනේරු | රේට් සම්බන්ධයෙන් ගන්නා ලද තීරණයන් තනි පුද්ගල තීරණයන් නොවන අතර අමාත්‍යාංශ ලේකම් සහ වනජීවී අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු කමිටුවක් මගින් සාකච්ඡා කර ගන්නා ලද | නියමිත රේටයන් භාවිතා කර ඇස්තමේන්තු සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඇස්තමේන්තුව රු.49,534,056 කින් වැඩියෙන් සිදුකර තිබුණි. මේ හේතුවෙන් කියුබික් මීටර් 91,278.09 ක් සඳහා නියමිත පිරිවැයට වඩා රු.28,478,736 ක් ගෙවා තිබුණි. | තීරණයන් බව දන්වමි. | |
| (ආ) | කපන ලද අගල භෞතික පරික්ෂාවේදී ආසන්න වශයෙන් ඝන මීටර් 3000 ක් පස්වලින් ගොඩවී තිබුණ අතර ඒ අනුව පස් ඉවත් කිරීම සඳහා රු.1,497,000 ක් පමණ වැය කිරීමට සිදුව වන බව නිරීක්ෂණය විය. තවද භූ විෂමතාවය නොසළකා පස් කැපීම හේතුවෙන් මෙසේ ගොඩ වන පස් නැවත ඉවත් කිරිමට වර්ෂයකට ආසන්න වශයෙන් රු.25,663,024 ක් වැය කිරිමට සිදු වන බව නිරීක්ෂණය විය. | පසෙහි ස්ථායිතාවය අඩු ස්ථාන ඇති අතර එහිදී හඳුනාගෙන ඇත්තේ එම ස්ථානවලින් ජලය කාණුව වෙත බැස යාමයි. එම ජල බැස යාම ක්‍රමවත් ලෙස සිදුකිරීමෙන් අගලේ කඩා වැටීම වැළැක්විය හැකි මුල් අදියරේ මෙම පිළිසකර කිරීම් සිදුකිරීමට සිදු වූවත් එයට යොදන ලද විසඳුම අනුව නැවත නැවත එය සිදුකළ යුතුය. | අලි අගල් කැපීමේදී භූවිෂමතාවය පිළිබඳ සැලකිලිමත් විය යුතුය. |
| (ඇ) | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අලි වැටක් ඉදිකිරීමට කටයුතු කර රු.3,792,458 ක් වැය කර තිබිය දී අගලක් නිර්මාණය කිරීමට අදාල වගකිව යුතු පාර්ශවයන් කටයුතු කිරිම හේතුවෙන් අලි වැට සඳහා වැය කළ මුදල නිශ්ක්‍රීය වියදමක් වී තිබුණි. | ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය විසින් ඒ දක්වා භෞතිකව සිදුකර ඇති අයිතමයන් දෙපාර්තමේන්තුව වෙත පවරා ගන්නා ලදී. ඒවා ඉදිරියේදි ඉදිකිරීම් ඇතොත් ඒ සඳහා භාවිතයට ගැනීමට නිර්දේශිතය. | අලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා සැලසුම් සහගතව ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | අලි වැට ඉදිකිරීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ද්‍රව්‍ය ලබා ගැනීම සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹ නොතිබුණ අතර අලි වැට ඉදිකිරීම සඳහා භාවිතා කරන ලද රු.800,000 ක යකඩ තට්ටු 5 ක් හා රු.43,500 ක් වටිනා අලි පුවරුවක් අත්තිඩිය අඩවි ආරක්ෂක කාර්යාලයේ නිශ්ක්‍රීයව තිබුණි. | මෙම ද්‍රව්‍ය යෝජිත අගලේ සිදුකළ යුතු ඉදිකිරීම් සඳහා යොදා ගන්නා තෙක් අත්තිඩිය අඩවි ආරක්ෂක කාර්යාලයේ රඳවා තබා ඇත. | අලි වැට ඉදිකිරීම සඳහා භාවිතා කරන ලද වත්කම් උපරිම ඵලදායීතාවය ලැබෙන පරිදි උපයෝජනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | අලි අගල කැපීමේ ව්‍යාපෘතිය 2021 ජුනි 03 දින අවසන් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 50 ක් විය. | සැලසුම් කීප අවස්ථාවක් සංශෝධනය කිරීමට යම් කාලයක් ගතවූ බැවින් නියමිත කාලරාමුව තුළ වැඩ නිමකිරීමට ප්‍රමාද වීම් සිදුවිය. එය කොන්ත්‍රාත්කරුගේ පාලනයෙන් බැහැර සිදුවීමක් නිසා කාල දිගුවක් ලබාදීම සිදුකළ යුතුය. | සැලසුම් කළ පරිදි අලි අහලේ ඉදිකිරීම් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 1982 අංක 41 දරන වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ 469 වන අධිකාරයේ(6)(1)(ඇ) වගන්තිය ප්‍රකාරව ජාතික උද්‍යානයක් තුල යම් පැළෑටියක් කැපීම, පොතු ගැසීම, සිඳීම, බැඳීම, පිළිස්සීම හෝ යම් ආකාරයකින් එයට හානි කිරීම් හෝ එය විනාශ කිරීම නොකළ යුතුය. එසේ වුවද අලිවැට ඉදි කිරීමේදී ගස් විශාල ප්‍රමාණයෙන් ඉවත් කර තිබුණු අතර ඒ පිළිබඳව සමීක්ෂණය කර ඉවත් කළ යුතු ගස් ප්‍රමාණය හඳුනාගෙන ඒවා ඉවත් කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | යෝජිත ලුණුගම්වෙහෙර අලි රැඳවුම් මධ්‍යස්ථානයේ අගල් කැපීමට පෙර ශක්තිමත් විදුලි වැට ඉදිකිරීම සඳහා හඳුනාගත් විදුලි වැට මාර්ගය ශුද්ධ කිරිමේදී ගස්වලට අවම හානි වන පරිදි ලඳු කැලෑ වගා තණ බිම් පිට්ටනි ඔස්සේ විදුලි වැට මාර්ගය ශුද්ධ කර ඇති අතර, එම මාර්ගය ඔස්සේ අහලක් කපා ඇති බවද, අගල් කැපිමේදී විශාල ගස් ඉවත් කර නොමැති බව සඳහන් කරමි. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (උ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23(ප) වගන්තියෙන් සංශෝධිත 1995 පෙබරවාරි 16 දිනැති අංක 859/14 දරන ගැසට් පත්‍රයේ පළ කර ඇති විධිවිධාන ප්‍රකාරව රක්ෂිත ප්‍රදේශයන් එළිපෙහෙලි කිරීම හා ව්‍යාපෘතියක් සිදු කිරීමට පෙර පාරිසරික ඇගයුම් වාර්තාවක් ලබා ගත යුතු වුවත් මේ පිළිබඳව පාරිසරික ඇගයුම් වාර්තාවක් ලබා ගෙන නොතිබුණි. | අගල් කැපීමට පෙර විදුලි වැට ඉදිකිරීම සඳහා පරිසරයට අවම හානි වන පරිදි විදුලි වැට මාර්ගය ශුද්ධ කිරීමට කටයුතු කර තිබීම හේතුවෙන් අගල් කැපිමට පාරිසරික ඇගයිමක් සිදුකර නොමැති බව සඳහන් කරමි. | පනත ප්‍රකාරව පාරිසරික ඇගයීම් වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර අලි වැටට අදාළ පාරිසරික වාර්තාව අලි අහල සඳහා යොදා ගැනීමට කටයුතු නොකළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඌ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 137(5) ප්‍රකාරව සැපයීම් සම්බන්ධයෙන් වන අවස්ථාවලදී ඒවා පරීක්ෂා කර නිවැරදි ලෙස භාර ගෙන තිබෙන බවට ගෙවීම් අනුමත කරන නිලධාරියා සෑහීමකට පත් විය යුතුය. අලිවැට ඉදි කිරීම සඳහා රේල්පීලි කොටස් 4,333 ක් ලබා ගැනීම සඳහා රු.15,815,099 ක් භාණ්ඩ ලැබීමට පෙර ගෙවා තිබුණු අතර 2022 අප්‍රේල් වන විටත් සපයා තිබූයේ රේල් පීලි කොටස් 660 ක් පමණක් විය. | මෙම රේල් පීලි කැපීම, පැටවීම, දුම්රිය මගින් ප්‍රවාහනය දුම්රිය දෙපාර්තමේන්තුව මගින් සිදුකරන නිසා වැය වූ වියදම් ගෙවීමට කටයුතු කරන ලද අතර රේල් පීලි කොටසක් පමණක් ලැබී තිබූ අතර ඉතිරි කොටස් ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2009 අංක 22 දරන වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනතේ II වන උපලේඛනයට ඇතුළත් වන දැඩි ලෙස ආරක්ෂිත ක්ෂීරපායී සතුන් සහ උරගයින් වර්ගයට අයත් කැස්බෑවන්, තල්මසුන් සහ ඩොල්ෆින් සතුන් 439 ක් පර්ල් එක්ස්ප්‍රස්වේ නෞකාව ගිනි ගැනීම හේතුවෙන් මිය ගොස් තිබුණි. මිය ගිය සතුන් සොයා ගැනීමේ පරීක්ෂණ වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් රු.2,378,249 ක් දරා තිබුණද එම මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට 2022 අප්‍රේල් වන විටත් කටයුතු කර නොතිබුණි. එසේම එම මුදල ලැබිය යුතු මුදලක් ලෙස අරමුදලේ ගිණුම්වල දක්වා නොතිබුණි. | හානි ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා කම්ටු වෙත දැනුම්දී ඇත. | මෙම මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට සහ විධිමත් පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක ගත කාර්යයන් 03 ක් සඳහා රු.2,535,000 ක ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණද ඒවා ක්‍රියාත්මක කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ 2021 අගෝස්තු 31 දිනැති අංක 21/1596/304/134 දරන ලිපිය මගින් දන්වා ඇති පරිදි ක්‍රියාකාරකම් සිදු නොකිරීම, හදිසි අවශ්‍යතාවන් සඳහා ප්‍රතිපාදන වෙන් කළද එවැනි අවශ්‍යතාවන් ඇති නොවීම හේතු විය. | ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්ක ගත කාර්යයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 06 ක් සඳහා රු.28,786,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද එම කාර්යයන්හි භෞතික ප්‍රගතිය සියයට 50 ට වඩා අඩු මට්ටමක පැවතුණි. | ඉදිරියේදී නිමකිරීමට කටයුතු කිරීමට නියමිතය. | ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්ක ගත කාර්යයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |